


**නිශාධි** පිබිදෙන විට උදෑසන නවය ද පසුව තිබුණි. ඇඳෙන් නැගිටින්නට උත්සාහ නොකර අලස ලෙස වැතිර සිටි ඈ හිස හරවා කැඩපතින් පෙනෙන සිය රුව දෙස බලා සිටියා ය. අවුල්ව ගිස වරලස නිදිමතින් කුඩා ව ගිය ඇස් රත් පැහැ ගත් දෙතොල් මේ සියල්ල කියන්නේ පෙරදා රාත්‍රිය පිළිබඳ රහසක් නොවේ නම් වෙන කුමක් ද?

තමා කාමරයට නැවත ආවේ කීයටදැයි මෙනෙහි කරන්නට ඇය උත්සාහ කළා ය. කොපමණ වේලාවක් අනුරාධ ගේ කාමරයේ සිටියා ද කියාවත් නිනව්වක් ඇයට නොවී ය. ඇගේ මතකයේ රැඳී තිබූ එකම දෙය තවමත් සිතට දැනෙන ඔහුගේ ආකර්ශණීය සුවඳ පමණක් විය. ඔහුගේ ආදරණීය ආලිංගනය කෙතරම් සුවදායක වී ද? එයින් ගැලවී මිදී දුව එන්නට සිතක් පහල නොවීම පුදුමයක් ද? ''මම ඔයාට ආදරෙයි නිශාධි. . ''. ඔහු වරින් වර මිමිණූ බව ද ඇයට මතකය. මේ ආදරය ද අනුරාගය ද යන්න තෝරා බේරා ගන්නට තරම් කල්පනාවක් ඒ මොහොතේ දී ඇයට නොවී ය. ඈ ඔහුගේ ආලිංගනයෙන් මත්ව සිටියා ය. ඔහුගෙන් මිදී පලා යන්නට ඇයට අවශ්‍ය නොවී ය. යටි සිත විසින් මහත් ඕනෑකමකින් ඉල්ලා සිටින ලද ඒ උණුසුමට ඈ තව තවත් වසඟ වූවා ය.
බොහෝ වේලාවකට පසුව, සිය උරපත මත වූ ඇගේ හිස මත සිය මුහුණ හොවා ගත් වන ම ඔහු සුවදායක නින්දකට වැටී සිටියේ ය. ඉතා

*ගිම්හාන රැයක වට හිම පියලි*
*රැගෙන දෝතින් එකතු කර ගතිමි*
*කුමන අරුමයද මේ නොම දනිමි*
*මේ මොහොත ජීවිතය කර ගනිමි*

*විහඟ ගීතය ඇසෙයි මේ පැයේ*
*රාත්‍රිය බව නොදැන යයි සිතේ*
*මේ අරුම හෝරාව තුළ ප්‍රියේ*
*සැනසෙන්න අප පමණි මේ ලොවේ*

*අරුණැල්ල හිම පියලි සිප ගන්න*
*මොහොතකට පෙර ඔබත් පිබිදෙන්න*
*සිහින මල් පරවෙනා සැටි අන්න*
*දැන් ඉතින් ඇති තරම් දැකගන්න*

සීරුවෙන් ඔහුගේ ග්‍රහණයෙන් ගැලවී ගත් නිශාධි ඇඳෙන් නැගී සිටියා ය. සිතේ නැඟ ආ මහත් වූ තෘෂ්ණාවකින් යුතුව ඔහුගේ නළලතේ හාදුවක් තැන්පත් කළ ඈ කාමරයෙන් පිට වූවා ය.

ඒ වන විට වේලාව උදෑසන තුන පසුව තිබෙන්නට ඇතැයි දැන් ඇයට අනුමානයට සිතෙයි.

කිසිවකු දොරට සන් කරණු නිශාධිට ඇසුණි.

''නිශාධි. .'' ඒ පවිත්‍රාගේ කටහඬ ය.
''වරෙන් ඇතුළට. .'' නිශාධි ඇඳෙන් නොබැස ම කීවා ය.

කාමරයට ඇතුල් වූ පවිත්‍රා නිශාධිගේ ඇඳ කොණකින් වාඩි වූවා ය.

''මොකද මේ තාම නිදි.?'' ඈ ඇසුවේ නිශාධි පොරවාගෙන සිටි පොරවනයෙන් අදින අතරය.
''නිදිමතයි. .''
''වෙලාව කීයද දන්නව ද?''
''. .''

''දහයයි තිහයි. . මොකද මේ ඇස් රතුවෙලා.? මූණත් ඉදිමිලා වගේ. . ඊයෙ රෑ නිදි මැරුව ද?''

නිශාධි පිළිතුරක් නොදී කල්පනා කළා ය.. ඊයේ රාත්‍රිය ගැන මිතුරියට කියන්නේ කෙසේ ද? සියල්ල ඇයට කියා ඒ අත්දැකීම ඇය හා බෙදා ගන්නට තිබුණා නම් කෙතරම් අපූරු ද?

''අපි යනවා එළියට. .. එනවද.?'' නිශාධිගෙන් පිළිතුරක් බලා සිටි පවිත්‍රා ඇසුවා ය.

''මට නිදිමතයි.'' නිශාධි කීවා ය.

''මේක මාර නින්දක්නෙ. . කමක් නෑ උඹ නිදාගනින්. . අපි යනවා. .'' පවිත්‍රා කාමරයෙන් පිටව යන්නට සැරසී කීවා ය. දොර අසළදී ඈ ආපසු හැරී නිශාධී දෙස බැලුවා ය. ''අද අඳිනකොට අමතක නොකර බෙල්ල වැහෙන ඇඳුමක් ඇඳපන්. . '' ඈ කිවා ය.

''ඇයි.?'' නිශාධි ඇසුවා ය.

පවිත්‍රා දඟකාර බැල්මක් නිශාධි වෙත හෙලුවා ය. අනතුරුව සිය දබරැඟිල්ල ගෙල පාමුල ට යොමු කළා ය. ''කණ්නාඩියෙන් බලපං.''

නිශාධි ඇඳෙන් පැන කණ්නාඩිය ඉදිරියේ සිට ගත්තා ය. සිය ගෙල පාමුල වු රතු පැහැ පැල්ලම දුටු වන ම ඈ ලජ්ජාවෙන් රතුව ගියා ය. සිය මිතුරියගේ මුහුණ බලනු නොහැකිව ඈ කණ්නාඩිය දෙස ම බලා සිටියා ය.

''ංහා. . ංහා. . නිදහසට කාරණා කියන්න වචන හොයන්න මහන්සි වෙන්න ඕනෙ නැහැ. වහු පැටියා හැරෙන්නෙ කෙහෙල් ගහ කන්න බව මම නං දැනං හිටියා.. තව ටිකක් නිදාගනිං. . ඔන්න මං ගියා. .'' පවිත්‍රා සිනා සී කාමරයෙන් පිටවූවා ය.

0000000

නිශාධි පහත මාලයට ආවේ දිවා ආහාර වේලාවේ දී ය. ආහාර ශාලාවේ කොණක වූ මේසයක අනුරාධ වාඩි වී සිටිනු ඈ ඈත තියාම දුටුවා ය. ඔහුට මුහුණ දිය නොහැකි බවක් මොහොතකට ඇයට දැනුණි. ආපසු හැරී යන්නට ද ඈ සිතුවා ය.

''නිශාධි. .'' ඈ සිතැඟි හඳුනාගත් සේ අනුරාධ ඇය ඇමතුවේ ය.



නිශාධි බිම බලාගත්වන ම ඔහු සිටි මේසය වෙත ගියේ ය.

''වාඩිවෙන්න. .'' ඔහු කීවේ ය. ඈ නිහඬව ඔහු ඉදිරියේ වූ අසුනක වාඩි වූයේ ය.

''ඇයි යන්න හැදුවෙ. .?'' ඔහු පහත් හඬින් ඇසුවේ ය.

ඈ නිහඬව මේසය මත වූ මල් බඳුන දෙස බලා සිටියා ය. ඔහු ඉතා සීරුවෙන් මේසය මත වූ ඇගේ දකුණත අල්ලා ගත්තේ ය. ඒ අත ඔහුගෙන් මුදා ගන්නට ඇය වෑයම් නොකළා ය.

''නිශා. . '' ඔහු මිමිණුවේ ය. ''මම ඔයාට ආදරෙයි. .''
ඈ ඔහු දෙස එක එල්ලේ බැලුවා ය.

''ඊයේ රෑ වෙච්ච දේවල් අමතක කරන්න. .'' ඈ සෙමින් කීවා ය. ''. .ඒක . . ඒක. . ලොකු වරදක්''

''එහෙම හිතන්න එපා. . ඒක ලස්සන හීනයක්.'' ඔහු කීවේ ය. නිශාධි සිනාසුණා ය.
''ඔයාට හැම දෙයක්ම චිත්‍රපටියක් වගේ. .'' ඈ කිවා ය.

''මම රඟපාන චරිත දිහා බලලා මා ගැන තීරණ ගන්න එපා නිශාධි. .'' ඔහු කීවේ ය. ''මම ජීවිතේ ගැන හුඟක් ගැඹුරට හිතන කෙනෙක්. . නොමඟ යන්න ඕනෙ තරම් අවස්ථාව තියෙද්දි නම නරක් කර ගත්තෙ නැති මනුස්සයෙක් මම. .''

නිශාධි සීරුවෙන් ඔහුගේ අතින් තම අත මුදා ගත්තා ය.

''අනුරාධ. . මම. . මම'' ඇය යමක් කියන්නට උත්සාහ කළා ය.

''කියන්න..'' ඔහු මහත් ඕනෑ කමකින් අසා සිටියේ ය.

''අනුරාධ.. අනුරාධ මම බැඳපු කෙනෙක්. .''

තමාගේ කතාවෙන් ඔහු කලබල වනු ඇතැයි ඈ සිතා සිටියා ය. එනමුදු කිසිදු කැළඹිල්ලක ස්වරූපයක් ඔහු වෙතින් දිස් නොවුණි. ඔහු බොහෝ නිවුණ බැල්මකින් ඇගේ නෙත් දෙස එබී බලා සිටියා පමණි.

''අනුරාධ ඔයාට ඇහුණ ද. මං කියපු දේ.? මම බැඳපු කෙනෙක්'' නිශාධි නැවත කීවා ය.

''මට ඇහුණා නිශාධි. .'' ඔහු සිනාසුණෝ ය ''ඒක තියෙන්නෙ නීති පොතේ නේද.?. .හදවතේ නීති පොතක් නැහැ. බැඳීම් ඇති වෙන්නෙ හිතේ මිස පොතේ නෙවෙයි නිශා''

''මට ආපහු ඉක්මනින් ඔස්ට්‍රේලියාවට යන්න වෙනවා අනුරාධ. . තේරුමක් නැති වැඩ නොකර ඉමු. . අපි තේරුමක් ඇති වැඩක් කරමු. . '' නිශාධි මල් බඳුනේ මල් පෙත්තක් සිනිඳුවට පිරිමදින අතර කීවා ය.

''ලෝකය අද හරි පුංචියි නිශා. . මම ඔයා හොයාගෙන එනවා. .''

''ඇවිත්. .?''
''ඇවිත් ඔයාට මගේ ළඟට ගන්නවා. .''

නිශාධි හඬ නගා සිනාසුණා ය.

''ඔයා හරියට පුංචි ළමයෙක් වගෙයි අනුරාධ. . නොකෙරෙන දේවල් ගැන හීන දකින්න එපා. .''
''මං මෙච්චර කල් හීන දැක්කෙ නැහැ නිශා. . ඒත් ඊයේ රෑ ඒ ඔක්කොම වෙනස් වුණා. . දැන් මං හීනයක් දකිනවා. . ලස්සන හීනයක්. . ඒ හීනය සැබෑ කරගන්න මං ජීවිතේ වුණත් දෙනවා. .''

''පිස්සා. .'' නිශාධි පළමු වරට සැහැල්ලුවෙන් සිනාසුණා ය. ඔහු ද ඇය අනුව යමින් සිනාසුණෝ ය.

''අද මට ෂූටිං නැහැ. . අපි යමු පොඩි රවුමක්. . මං දන්න ලස්සන තේ වත්තක් තියෙනවා. . නිකම් ඩ්‍රයිව් එකකට යමු. .'' ඔහු මහත් උද්යෝගයකින් ඇසුවේ ය. නිශාධි මොහොතක් කල්පනා කළා ය.

ඔහු සමඟ මොහොතක් තනිවන්නට අකැමැති වන්නේ කුමටදැයි ඇය සිතුවා ය. ජීවිතයේ යළි කිසි කලෙක මෙවන් දිනයක් උදා නොවනු ඇත. මේ මිහිරි සිහිනය ඇති තරම් විඳ ගත යුතු ය.

''යමු. .'' ඈ කීවා ය.

0000000

අනුරාධ වාහනය පැදවූයේ බොහෝ කල්පනාවෙනි. සිරි පොදය නිසා තෙත්ව තිබූ පාරේ වේගයෙන් රිය ධාවනය කිරීම නුසුදුසු බව ඔහු දැන සිටියේ ය. නුවරඑළියෙන් පිටවන තෙක්ම ඔවුන් අතර කතා බහක් නොවී ය.
මහා මාර්ගය අද්දර මල් කූඩයක් තබාගෙන සිටි දැරිය අසළ අනුරාධ වාහනය නැවැත්තුවේ ය. වචනයකුදු නොදොඩා මල් කූඩයට අත දමා රතු මල් පොකුරක් අතට ගත් අනුරාධ නිශාධි වෙත හැරුණෝ ය.

''මේ අපි දෙන්නා වෙනුවෙන්. . අපේ හමුවීම වෙනුවෙන්... අපේ එක්වීම වෙනුවෙන්...'' ඔහු දෝතින්ම ඒ මල් පොකුර ඇයට පිලිගැන්නුවේ ය. ඔහු ගේ දෙනෙතෙහි වූ හෘදයාංගම බැල්ම ඇගේ සිත සසළ කළේ ය. ''.... මම ඔයාට ආදරෙයි නිශා...''

මල් පොකුර තුරුළු කරගත් වන ම නිශාධි අනුරාධ ගේ උරහිස මත සිය හිස තබා ගත්තා ය. ඔහු මහත් සෙනෙහසකින් ඇගේ හිස සිප ගත්තේ ය.

''මහත්තයා සල්ලි....'' දැරිය ගේ